# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1534/18 - 2008 පෙබරවාරි 01 වැනි සිකුරාදා - 2008.02.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 4/81

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23අ සහ 23ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

පාඨලී චම්පික රණවක,
පාරිසරික හා ස්වභාවික සම්පත්
අමාත්‍ය.

2008 ජනවාරි මස 14 දින,
කොළඹ දී ය.

නියෝග

01. මෙම නියෝග 2008 අංක 1 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ව) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

1 වන කොටස

*අපද්‍රව්‍ය මෝචනය හෝ බැහැර කිරීම සඳහා වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.*

02. කිසිම තැනැත්තකු විසින් -

(අ) (මෙහි මින්මතු “අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ මිස ; සහ

(ආ) යම් නිශ්චිත කර්මාන්ත සම්බන්ධයෙන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ප්‍රමිති හා උපමානවලට අනුකූලව මිස,

පරිසරයට අපද්‍රව්‍ය බැහැරකිරීම, එහි තැන්පත් කිරීම හෝ පරිසරයට මෝචනය කිරීම හෝ පරිසර දූෂණය හෝ ශබ්ද දූෂණය සිදු කරන හෝ සිදු කිරීමට ඉඩ ඇති අවස්ථානුගත කරුණුවල දී 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ආ වගන්තිය යටතේ නිශ්චය කරන ලද නියමිත කටයුත්තක් සිදුකිරීම නොකළ යුතුය.

3. ඉහත 2 වන නියෝගයේ කුමක් සඳහන්ව තිබුණ ද, අධිකාරිය විසින් අපද්‍රව්‍ය ලබන්නා වූ පරිසරය ආරක්ෂා කිරීමට ඇති අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, නියමිත කටයුතු හෝ ක්‍රියාවලියක් සම්බන්ධයෙන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ප්‍රමිති හා උපමානවලට වඩා දැඩි ප්‍රමිති හා උපමාන, 12 වන නියෝගය යටතේ නිකුත් කරන ලද විධානයක් මගින් පැනවිය හැකිය .

4. බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ යම් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ද එම ක්‍රියාකාරකම් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ප්‍රමිති හා උපමානවලින් ආවරණය වී නැති අවස්ථාවක අධිකාරිය විසින් එම ඉල්ලුම් පත්‍රය පිළිබඳව කුසලතා අනුව පරීක්ෂා කොට එම ඉල්ලුම්පත්‍රයට ආදාල ප්‍රමිති සහ උපමාන නිශ්චිතව සඳහන් කරමින් ඉල්ලුම්පත්‍රයට අවසර දිය යුතු අතර, ඉල්ලුම්කරු පරිසරය ආරක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් ඔහුට නිකුත් කරනු ලබන සියළු විධිවිධාන පිළිපැදිය යුතු ය.

5. (1) බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන්නා වූ විට-

(අ) නියෝගයෙන් බලයලත් ක්‍රියා කෙරෙන එක් එක් නියමිත කටයුත්ත වෙනුවෙන් වෙන් වෙන් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය ;

(ආ) ඉල්ලුම් පත්‍රය මෙහි II වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ සඳහන් “අ” ආකෘතියට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය ;

(ඇ) කටයුත්ත ආරම්භ කිරීමට අවම වශයෙන් දින තිහකට පළමුව ඉදිරිපත් කළ යුතු ය ;

;

(ඉ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනුම්දුන් පසු සෑම අයදුම්කරුවෙකුම මෙහි III වන උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතු ය.

(2) ඉහත කී II වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ “අ” ආකෘතියේ සඳහන් කිරීමට නියම කරනු ලබන සියළුම විස්තර ද බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ තීරණයක් කිරීම සඳහා අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ද සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම සැපයිය යුතු ය.

6. අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම -

(අ) මෙහි II වන උපලේඛනයේ සඳහන් “ආ” ආකෘතියට සාරානුකූල විය යුතු ය ;

(ආ) පනතේ 23 ඈ වන වගන්තිය යටතේ යම් අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට යටත්ව බලපත්‍රයේ සඳහන් පරිදි වසර තුනක් නොඉක්මවන්නා වූ කාලපරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතු ය ;

(ඇ) අළුත් කළ හැකි විය යුතු ය.

7. අධිකාරිය විසින් පහත සඳහන් කරනු ගැන, එනම්.

(අ) පනතේ හෝ පනත යටතේ සාදනු ලබන නියෝගවල, විධිවිධාන කඩකිරීම සඳහා බලපත්‍රය යොදාගනු නොලබන බවට ;

(ආ) බලපත්‍රයෙන් බලය ලැබී ඇති ක්‍රියාකාරකම් හේතුවෙන් යම් තැනැත්තෙකුට හෝ පරිසරයට ප්‍රතිවර්තනය කළ නොහැකි අලාභ හෝ හානි හෝ යම් උපද්‍රවයක් හෝ සිදු නොවන බවට ;

(ඇ) නීතියේ අවශ්‍යතාවන්ට අනුකූලව පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවට;

සෑහීමකට පත්වුවහොත් පමණක් බලපත්‍රය නිකුත් කළ යුතු ය.

8. (1) බලපත්‍රයක් අළුත්කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම -

(අ) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයේ කාලය අවසාන වන දිනයට යටත් පිරිසෙයින් තුන් මසකට පෙර හෝ බලපත්‍රයෙන් බලය ලැබී ඇති ක්‍රියා සිදුකරන ස්ථානයේ යම් වෙනස් කිරීමක්, අලුත්කිරීමක් හෝ විශාල කිරීමක් සිදු කිරීමට එක් මසකට පෙර ඉදිරිපත් කළ යුතුය. ;

(ආ) මෙහි II වන උපලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය ;

(2) බලපත්‍රයක් අළුත්කිරීම සඳහා ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉහත කී II වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ 'අ' ආකෘතියේ සඳහන් කිරීමට නියම කරනු ලබන සියළු විස්තර ද බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ තීරණයක් සඳහා අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් යම් තොරතුරු ද සැපයිය යුතු ය.

(3) සෑම අයදුම්කරුවෙකුම බලපත්‍රයක් අළුත්කිරීම සඳහා මෙහි III වන උපලේඛනයේ සඳහන් අළුත්කිරීම සඳහා වූ බලපත්‍ර ගාස්තු අධිකාරිය විසින් දැනුම් දීමක් කළ පසු එකී දැනුම් දුන් කාලසීමාව ඇතුලත ගෙවිය යුතු ය.

9. අධිකාරිය විසින් පනතේ 23ඈ වගන්තිය යටතේ බලපත්‍රයක් අත්හිටුවමින් හෝ අවලංගු කරමින්, නිකුත් කිරීමට පෙර එම නියමය නිකුත් නොකිරීමට හේතු දැක්වීමේ අවස්ථාවක් බලපත්‍රධාරියාට දිය යුතු ය.

එසේ වුව ද, බලපත්‍රය නිකුත් කිරීමෙන් පසුව ස්වාභාවික සාධක නිසා හෝ වෙනත් හේතු නිසා අපද්‍රව්‍ය ලබන පරිසරය වෙනස් වී ඇති අවස්ථාවක හෝ බලපත්‍රය යටතේ නොකඩවාම අපද්‍රව්‍ය බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ මෝචනය කිරීම, වැඩදායි ලෙස පරිසරය උපයෝගී කර ගැනීමකට පටහැනි ලෙස බලපාන හෝ බලපෑ හැකි අවසථාවක අධිකාරිය විසින් නොපමාවම, නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් සඳහා බලපත්‍රය අත්හිටුවමින් නියමයක් නිකුත් කළ යුතු ය. *නැතහොත් බලපත්‍රය අවලංගු කළ යුතු ය.*

10.(1) බලපත්‍රයක් ප්‍රදානය කිරීමට අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් ඉල්ලුම්කරුවෙකු විසින් හෝ බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගුකිරීම සම්බන්ධයෙන් හෝ බලපත්‍රයක් අලුත්කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් බලපත්‍රධාරියෙකු විසින්, එම තීරණය තමාට නිවේදනය කරනු ලැබූ දිනයෙන් පසුව දින 30ක් ඇතුලත එම ප්‍රතික්ෂේප කිරීමට, අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ලියවිල්ලකින් වූ අභියාචනයක්, පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ හැකි ය.

(2) තමාගේ අභියාචනය සම්බන්ධයෙන් පෞද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකු මගින් කරුණු නියෝජනය කිරීමේ අවස්ථාවක් එම ඉල්ලුම්කරුට දිය යුතු ය.

(3) ලේකම්වරයා විසින් අභියාචනයට විෂය වූ තීරණය අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ ස්ථිර කිරීම කළ හැකි අතර, අධිකාරිය විසින් ලේකම්වරයාගේ තීරණය ක්‍රියාත්මක කළ යුතු ය.

(4) ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

11. *බලපත්‍රලාභියා විසින්* .-

(අ) බලපත්‍රයක් සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් සැපයූ විස්තර පිළිබඳ වෙනස්කම් හෝ යෝජිත වෙනස්කම් ;

(ආ) බලපත්‍රය අදාළ වන යම් ක්‍රියාකාරකමක් අවසාන කිරීමට ගත් යම් තීරණයක් පිළිබඳව;

වහාම අධිකාරියට දැන්විය යුතු ය. තව ද, පරිසර දූෂණය සහ පරිසර උපද්‍රව වැලැක්වීම හෝ අඩු කිරීම සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධාන ඔහු විසින් පිළිපැදිය යුතු ය.

12. සෑම ඉල්ලුම්කරුවකුම හෝ සෑම බලපත්‍රලාභියකුම අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් පරිසරය ආරක්ෂා කිරීම සඳහා දෙන ලද යම් විධාන පිළිපැදිය යුතු ය.

13. යම් නියෝගයක් කඩ කරමින් ක්‍රියාකරන සෑම තැනැත්තෙක්ම මේ පනතේ 31 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරන්නේ ය.

14. යම් නියමිත කටයුත්තක් සිදු කරන යම් තැනැත්තෙක් එම කටයුත්ත ආරම්භ කිරීමට පෙර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතුය.

## II වන කොටස

### අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම

15. අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර සහ අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ප්‍රමිති සහ වෙනත් නිර්නායකවලට අනුකූලව මිස, VIII වන උපලේඛනයේ සඳහන් (මෙහි මින් මතු “උපලේඛනගත අපද්‍රව්‍ය” යනුවෙන් සඳහන් කරනු ලබන) අපද්‍රව්‍ය උත්පාදනය කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, නිෂ්කර්ෂණය කිරීම, ප්‍රතිචක්‍රීයකරණය කිරීම හෝ බැහැර කිරීමට හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් පිහිටුවීම හෝ පහසුකමක් කිසිම තැනැත්තකු විසින් කරනු හෝ සපයනු නොලැබිය යුතු ය.

16.15 වන නියෝගය යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම IV වන උපලේඛනයේ දක්වා ඇති “අ” ආකෘතියට සාරානුකූල විය යුතු අතර-

(අ) 15 වන නියෝගයේ සඳහන් යම් ක්‍රියාවක් ඉල්ලුම්කරු විසින් කරගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් මහජනයාට සිදුවිය හැකි අනතුරු හෝ හානි ප්‍රමාණවත් ලෙස ආවරණය කිරීමට ප්‍රමාණවත් වන, අධිකාරියට පිළිගත හැකි වලංගු රක්ෂණ සහතිකයක් හෝ වෙනත් යම් ආකාරයක මූල්‍ය ඇපයක්, සහ

(ආ) පරිසරය ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය විය හැකි ලෙස අධිකාරිය විසින් සලකනු ලබන මෙම නියෝගවල IV වන උපලේඛනයේ “අ” ආකෘතියෙහි දක්වා ඇති වෙනත් යම් අතිරේක තොරතුරු හා කරුණුවල විස්තර එම ඉල්ලුම් පත්‍රය සමඟ එවිය යුතු ය.

17. 15 වන නියෝගය යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, පහත දැක්වෙන පදනම මත ගණන් බලන ලද ගාස්තුවක් සමඟ එවිය යුතු ය.

| | | |
|---|---|---|
| උත්පාදකයා | - | රු. 1,000 |
| එකතු කරන්නා | - | රු. 1,000 |
| ගබඩාකරු | - | රු. 10,000 |
| ප්‍රවාහක | - | රු. 2,000 |
| ප්‍රතිචක්‍රීකාරක | - | රු. 5,000 |
| නිෂ්කර්ෂක | - | රු. 5,000 |
| බැහැර කරන්නා | - | රු. 1,00,000 |

18. 16 වන නියෝගය යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුමක් ලැබුණු විට, උචිත යයි සලකනු ලබන යම් අනතුරු තක්සේරුවකින් පසුව අධිකාරිය විසින් ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

19. 18 වන නියෝගය යටතේ අධිකාරිය විසින් නිකුත් කරනලද සෑම බලපත්‍රයක්ම -

(අ) මේ නියෝගවල IV වන උපලේඛනයෙහි දක්වා ඇති ‘ආ’ ආකෘතියක සාරානුකූල විය යුතු ය ;

(ආ) මෙහි I වන උපලේඛනයේ සඳහන් ප්‍රමිති සහ උපමානවලට අමතර වශයෙන් බලපත්‍රයෙහි නියම කරනු ලැබ ඇති යම් නියම, කොන්දේසි සහ ප්‍රමිතිවලට යටත් විය යුතු ය ;

(ඇ) බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යම් කාල පරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතුය ;

(ඈ) අලුත් කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකාරිය විසින් 25 නියෝගයට යටත්ව අලුත් කරනු ලැබිය යුතු ය.

20. එකම වර්ගයේ උපලේඛනගත බහුවිධ අපද්‍රව්‍ය කළමනාකරණ මෙහෙයුම් සඳහා 17 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව, අධිකාරිය විසින් නිකුත් කරන ලද, එකම වර්ගයේ උපලේඛනගත බහුවිධ අපද්‍රව්‍ය කළමනාකරණ මෙහෙයුම් සඳහා වූ වෙනම බලපත්‍රයක් යටතේ හැර, කිසිම තැනැත්තකු විසින්, එකම භෞතික හා රසායනික ලක්ෂණික හෝ එහි අංශ කිසිවක් සහිත උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණයෙහි නොකඩවා නිරතවීම කරනු නොලැබිය යුතු ය. ඒ බලපත්‍රය, බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු නිශ්චිත කාලයක් සඳහා සහ නිශ්චිත උපලේඛණගත අපද්‍රව්‍ය ප්‍රමාණයක් සඳහා විය යුතු ය.

21. 18 වන, 19 වන හෝ 20 වන නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රයකින් මේ නියෝගවල මේ කොටසේ අර්ථානුකූලව සහ මේ නියෝගයේ I වන කොටසේ සඳහන්, උපලේඛනගත අපද්‍රව්‍ය සමග මිශ්‍ර කිරීමේ බලය ඒ මිශ්‍රණය නිසා දූෂණ කාරකවල බර ප්‍රමාණය අඩුවිය හැකි බව අධිකාරිය සෑහීමකට පත් වන පරිදි උත්පාදකයා එකතු කරන්නා, ගබඩා කරන්නා, ප්‍රවාහකයා හෝ බැහැර කරනු ලබන තැනැත්තා විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, දෙනු නොලැබිය යුතු ය.

22. මේ නියෝගවල මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොපැවරිය යුතු අතර, මේ නියෝග කඩ කරමින් කරන ලද යම් පැවරීමක්, නිකුත් කරන ලද බලපත්‍රය ශූන්‍ය සහ බල රහිත වන්නේ ය.

23. මේ නියෝගය යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා භාවිතා නොකළ යුතු ය.

24. මේ නියෝගවල මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් බලපත්‍රයේ නියම, ප්‍රමිති සහ කොන්දේසි කිසිවක් කඩකරමින් ක්‍රියාකරනු ලබන අවස්ථාවක, බලපත්‍රලාභියාට හේතු දැක්වීම සඳහා අවස්ථාවක් දීමෙන් පසු හා එම හේතු ලේඛනගත කිරීමෙන් පසු අධිකාරිය විසින් යම් නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් යම් කාලසීමාවක් සඳහා ඒ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම අත්හිටවනු ලැබිය හැකි ය. නැතහොත් අවලංගු කරනු ලැබිය හැකි ය.

එසේ වුවද, මහජන යහපත තකා එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීම ඉතා ඉක්මණින් කිරීම අවශ්‍ය යැයි අධිකාරිය සලකන්නා වූ අවස්ථාවක, මේ නියෝගය යටතේ පරීක්ෂණයක් පැවැත්වීම නිමවන තෙක් බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමේ බලය අධිකාරියට ඇත්තේ ය.

25. මේ නියෝගවල මේ කොටස යටතේ බලපත්‍රලාභියකු වෙත දෙන ලද යම් බලපත්‍රයකට අනුව, එම තැනැත්තා විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු සෙවීම සහ පරීක්ෂා කිරීමේ බලය අධිකාරියට ඇත්තේ ය.

26 (1) අධිකාරියට -

(අ) උපලේඛනගත අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන පිහිටුවීම ;

(ආ) උපලේඛනගත අපද්‍රව්‍ය ජනනය කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, නිශ්කර්ෂණය කිරීම, ප්‍රතිචක්‍රීයකරණය හෝ බැහැර කිරීමේ දී භාවිතා කළ යුතු ආරක්ෂක ක්‍රම ;

(ඇ) උපලේඛනගත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය හෝ නිශ්කර්ෂණය කිරීම,

පිළිබඳ මෙහෙයුම් සඳහා කලින් කල උපදේශ නිශ්චිතව දැක්වීමට බලය ඇත්තේ ය.

(2) (1) වන ඡේදය යටතේ සඳහන් කෙරෙන මාර්ග දර්ශක හැකි සෑම අවස්ථාවකදීම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීම සහ අන්‍යාකාරයකින් මහජනයා වෙත ලැබෙන්නට සැලැස්වීම කරනු ලැබිය යුතු ය.

27. (අ) උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, නිශ්කර්ෂණය කිරීම, ප්‍රතිචක්‍රීයකරණය කිරීම හෝ බැහැර කිරීම සම්බන්ධයෙන් මේ නියෝගවල මේ කොටසේ V වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලේඛන පවත්වාගෙන යාම ;

(ආ) උපලේඛනගත අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව, මේ නියෝගවල මේ කොටසේ VI වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරනුකූලව වූ වාර්ෂික වර්තාවක්, ඒ කාර්ය සම්බන්ධයෙන් අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් යථා පරිදි සහතික කරවා අධිකාරිය වෙත යැවීම ;

(ඇ) අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු අධිකාරිය වෙත වාර්ෂිකව ඉදිරිපත් කිරීම ;

(ඈ) තමා විසින් එකතු කරන ලද, ගබඩා කරන ලද, ප්‍රවාහනය කරන ලද, නිශ්කර්ෂණය කරන ලද, ප්‍රතිචක්‍රීයකරණය කරන ලද, සහ බැහැර කරන ලද උපලේඛනගත අපද්‍රව්‍යවල ප්‍රමාණය, වර්ගය, තත්ත්වය සහ සම්භවය බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යා යුතු ලේඛනගත සටහන් කිරීම ;

සෑම බලපත්‍රලාභියකුගේම කාර්යය විය යුත්තේ ය.

28. 27 වන නියෝගය යටතේ පවත්වාගෙන යනු ලැබිය යුතු ලේඛනය, කවර විටක දී වුවද අධිකාරිය විසින් පරීක්ෂා කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් සූදානමින් තැබිය යුතු අතර, ගාස්තුවක් ගෙවනු ලබන විට, මහජනයාගෙන් යම් කෙනෙකුගේ ඉල්ලීම පිට, එසේ පවත්වාගෙන යනු ලැබූ ලේඛනයක යම් උධෘතයටක සහතික කළ පිටපත නිකුත් කිරීම, බලපත්‍රලාභියකුගේ කාර්යය විය යුතු ය.

29. මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන බව නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා අධිකාරියේ යම් බලයලත් නිලධරයකු හෝ පොලිස් නිලධරයෙකු හෝ විසින්,

(අ) උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය කිරීමේ, එකතු කිරීමේ, ගබඩා කිරීමේ, නිශ්කර්ෂනය කිරීමේ, ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ, හෝ බැහැර කිරීමේ යම් උපකාරක ස්ථානයක හෝ ස්ථානයකට ඇතුල් වී පරීක්ෂා කිරීම ;

(ආ) උපලේඛනගත අපද්‍රව්‍ය ඇතැයි සැක කෙරෙන යම් මාර්ගස්ථ වාහනයක් නවතා පරීක්ෂා කිරීම ;

(ඇ) මේ නියෝග යටතේ, පවත්වාගෙන යනු ලබන ලේඛන කිසිවක් පරීක්ෂා කර, ඒ ලේඛනවල පිටපත් ගැනීම ;

(ඈ) උත්පාදනය කළා වූ, ප්‍රවාහනය කළා වූ, ගබඩා කළා වූ, එකතු කළා වූ, නිශ්කර්ෂණය හෝ ප්‍රතිචක්‍රීයකරණය කළා වූ හෝ බැහැර කළා වූ ද, උපලේඛනගත අපද්‍රව්‍යවල සාම්පල ගැනීම

කරනු ලැබිය හැකි ය.

30. මේ නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

31. උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණයෙහි යෙදුනු සෑම තැනැත්තකු විසින් ම වෙන යම් නීතියක් යටතේ නියමිත වෙන යම් සංඥා හෝ සළකුණුවලට අතිරේකව -

(අ) උත්පාදක හෝ ගබඩා ස්ථානයෙහි ;

(ආ) ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන වාහනවල ;

(ඇ) එකතු කිරීම හා ගබඩා කිරීම සඳහා භාවිත කරනු ලබන කන්ටේනරය හෝ ටැංකිවල ; සහ

(ඈ) අනුමත කළා වූ හෝ නොකළා වූ බැහැර කිරීමේ ස්ථානවල.

පහත දැක්වෙන ප්‍රකාශය සහ දෘශ්‍ය සංඥාව ඇතුලත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පෙනෙන දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

"අනතුරු අඟවීමයි, මනුෂ්‍ය සෞඛ්‍යයට සහ පරිසරයට අනතුරුදායක අපද්‍රව්‍ය ඇතුළත් වේ"

32. මේ නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රය හෝ එහි සහතික කරන ලද පිටපතක් උපලේඛනගත, අපද්‍රව්‍ය ප්‍රවාහනය කෙරෙන වාහනයේ ගෙන යා යුතු අතර, යම් පොලිස් නිලධරයකු හෝ අධිකාරිය විසින් බලය දෙන ලද වෙනත් නිලධරයකු හෝ විසින් පරීක්ෂා කිරීම සඳහා, වාහනයේ රියැදුරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

33. සෑම උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය කරන්නෙක්, එකතු කරන්නෙක්, ගබඩා කරන්නෙක්, ප්‍රවාහකයෙක්, ප්‍රතිචක්‍රීයකරණයක් කරන්නෙක්, නිශ්කර්ෂකයෙක් සහ බැහැර කරන්නෙක් විසින් ම-

(අ) සියළුම සේවා නියුක්තයන් ප්‍රමාණවත් ලෙස උපලේඛගත අපද්‍රව්‍ය හැසිරීමෙහි පුහුණු කරන ලද බවට වගබලා ගත යුතු අතර, එහි සේවා නියුක්තයන් එසේ පුහුණු කිරීමට වගබලා ගැනීම සඳහා ගත් පියවර පිළිබඳව අර්ධ වාර්ෂික පදනමක් මත අධිකාරිය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ආ) අධිකාරිය විසින් අනුමත කරන ලද නිතිපතා යථාවත් කරනු ලබන හදිසි ක්‍රියා මාර්ග සැලැස්මක් තිබිය යුතුය ;

(ඈ) උපලේඛනගත අපද්‍රව්‍ය හසුරුවන්නා වූ සියළුම සේවා නියුක්තයන් උචිත ඇඳුම් සහ වෙනත් පූර්වාරක්ෂක ක්‍රම මගින්, උපලේඛනගත අපද්‍රව්‍ය වලින් සිදුවිය හැකි අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කිරීමට වගබලාගත යුතු ය ;

(ඈ) හදිසි අවස්ථා ඇතුළු සියළු අවස්ථාවල දී සේවා නියුක්තයන් සහ මහජනයා සඳහා ක්ෂණික සහ ප්‍රමාණවත් වෛද්‍ය පහසුකම් තිබිය යුතු බවට වගබලා ගත යුතු ය.

34. සෑම උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදකයකු, එකතු කරන්නෙකු, ගබඩාකරුවකු, ප්‍රවාහකයකු, ප්‍රතිචක්‍රීයකරණය කරන්නකු, නිෂ්කර්ෂකයකු හෝ බැහැර කරන්නෙකු විසින් ම උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය කිරීමේ, එකතු කිරීමේ, ගබඩා කිරීමේ, ප්‍රවාහනය කිරීමේ, ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ, නිශ්කර්ෂණය කිරීමේ හෝ බැහැර කිරීමේ කාලය තුළ දී හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන්නට ඇතැයි සලකන යම් හදිසි අනතුරක් පිළිබඳව, මේ නියෝගවල, මේ කොටසේ VII වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව, අධිකාරිය වෙත වහාම වාර්තා කරනු ලැබිය යුතු ය.

35. උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය කරනු ලබන්නා වූ හෝ නිපදවන්නා වූ යම් කටයුත්තක් කරනු ලබන හෝ උපලේඛනගත අපද්‍රව්‍ය සන්තකයේ හෝ පාලනයේ ඇති, නැතහොත් ශ්‍රී ලංකාවට උපලේඛනගත අපද්‍රව්‍ය ආනයනය කරන සෑම තැනැත්තකුම විසින් ම -

(අ) අවස්ථාවෝචිත පරිදි එක් එක් වර්ෂයේ ජූලි මස 31 වන දින සහ ජනවාරි මස 31 වන දින හෝ ඊට පෙර, කලින් මාස හය තුළ දී උත්පාදනය කරන ලද්දාවූ හෝ නිපදවන ලද්දා වූ හෝ සන්තකයේ හෝ පාලනයේ ඇත්තා වූ, නැතහොත් ආනයනය කරන ලද්දා වූ අපද්‍රව්‍යවල ප්‍රමාණය සහ ගති ලක්ෂණ සහ සැකසුම් විස්තර සහ රසායනික භාවිතයේ දී වන වෙනස්කම් පිළිබඳ තොරතුරු ද ඇතුළුව ඊළග වර්ෂය සඳහා, අවස්ථාවෝචිත පරිදි එසේ උත්පාදනය කළ හැකි වන්නා වූ හෝ නිෂ්පාදනය කළ හැකි වූ ද, නැතහොත්, සන්තකයේ හෝ පාලනයේ ඇති විය හැකි වන්නා වූ ද, ආනයනය කළ හැකි වන්නා වූ ද, ඇස්තමේන්තු කරන ලද අපද්‍රව්‍ය ප්‍රමාණය සහ සංයුතිය පිළිබඳව ;

(ආ) උපලේඛනගත අපද්‍රව්‍ය කිසිවක් පිරියම් කිරීම සහ අවසන් වශයෙන් බැහැර කිරීම සඳහා යොදා ගත් ක්‍රම ද ඇතුළුව උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය හෝ නිෂ්පාදනය අඩු කිරීම හෝ ඉවත් කිරීම නැතහොත්, සන්තකයේ හෝ පාලනයේ තබා ගැනීම සඳහා වූ අදාළ කිරීමට යොදාගත් තාක්ෂණය පිළිබඳව,

අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය.

## III වන කොටස

### *සාමාන්‍ය*

36. අංක 595/16 දරන වර්ෂ 1990 ක් වූ පෙබරවාරි මස ප්‍රකාශයට පත් කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද වරින් වර සංශෝධනය කරන ලද 1990 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

37. (1) ඉහත කී නියෝගය පරිච්ඡින්න කිරීම නොතකා, එකී නියෝගය යටතේ කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මෙම නියෝගයට පටහැනි වන්නේ නම් මිස, එම ක්‍රියාව හෝ නොකර හැරීම බලාත්මක විය යුතු අතර, එය නීතියෙහි ලා බලාත්මක විය යුතු ය.

(2) 1990 පෙබරවාරි මස 16 වන දිනට පසු නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, එම බලපත්‍රය අදාල වන අයිතිවාසිකම් හා බැඳීම් ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා මේ යටතේ නිකුත් කරනු ලැබූ ලෙස සළකා වලංගු විය යුතු අතර දිගටම බලාත්මක විය යුතු ය.

38. මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අදහස් වේ ;

"අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ ;

"එකතු කිරීම" යන්නෙන් සුළු පරිමාණ වලින් උත්පාදනය කරන ලද අපද්‍රව්‍ය ඇතුළු තත්කාලයෙහි ගබඩා කෙරෙන උපලේඛනගත අපද්‍රව්‍ය සමග අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් වේ ;

" බැහැර කිරීම" යන්නට පරිසරයට හෝ පරිසරය මතට උපලේඛනගත අපද්‍රව්‍ය මෝචනය පිටකිරීමට, බැහැරලීමට හෝ බහා තැබීමට මග පෑදෙන ක්‍රියාකාරකම් ඇතුළත් වන අතර, ප්‍රතිචක්‍රීයකරණය සහ නිශ්කර්ෂණය වැනි වෙනත් ක්‍රියාකාරකම් වැඩිදුරටත් ඊට ඇතුළත් වේ

"පහසුකම්" උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය, එකතු කිරීම, ගබඩා කිරීම, ප්‍රතිචක්‍රීයකරණ සහ නිශ්කර්ෂණය ආනුෂංගික වන්නා වූ සැකසුම් කරගෙන යන්නා වූ ස්ථානය ;

"උත්පාදනය" කිරීම යන්නෙන්, යම් ක්‍රියාවකින් උපලේඛනගත අපද්‍රව්‍ය සෑදීම, නිෂ්පාදනය කිරීම, හෝ ඇති කිරීම අදහස් වේ ;

"බැර ලෝහ" යන්නෙන්, මූල ද්‍රව්‍ය පිළිබඳ ආවර්තිතා වගුවේ තඹ සහ රසදිය යන මූල ද්‍රව්‍ය ද ඇතුළුව එම මූල ද්‍රව්‍ය දෙක අතර පිහිටියා වූ ද, න්‍යෂ්ටික බර 63.546 සහ 200.590 අතර හා ඇතුළු මූල ද්‍රව්‍ය අදහස් වේ ;

"කළමනාකරණය " යන්නෙන්, සුළු පරිමාණයේ උත්පාදනය කරන ලද අපද්‍රව්‍ය ඇතුළුව, අපද්‍රව්‍ය උත්පාදනය කිරීම, එකතු කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, ප්‍රතිචක්‍රීයකරණය කිරීම, නිශ්කර්ෂණය කිරීම සහ බැහැර කිරීම අදහස් වේ ;

"උපලේඛනගත ද්‍රව්‍ය " යන්නෙන් මෙහි VIII වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් අපද්‍රව්‍යයක් අදහස් වේ ;

"ගබඩා කිරීම "යන්නට, පරිසරයට හෝ පරිසරයට මුදාහැරීම වළකාලන කොන්දේසි යටතේ සාධාරණ අවම කාලසීමාවක් සඳහා අපද්‍රව්‍ය ගබඩා කිරීම ඇතුළත් වේ ;

"ප්‍රවාහණය " යන්නෙන්, උත්පාදනය කිරීමේ, ආනයනය කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයෙන් බැහැරව බැහැර කිරීමේ කාර්යය සඳහා වූ ස්ථානයක් ද ඇතුළු වෙනත් යම් ස්ථානයකට ගෙන යෑම අදහස් වේ ;

"අපද්‍රව්‍ය " යන්නෙන් VIII වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් හා පනතේ විස්තර කර ඇති ලෙස අදහස් වේ.

## I වන උපලේඛනය

### *I වන ලැයිස්තුව*

රට අභ්‍යන්තර ජලාශවලට මුදාහරිනු ලබන කාර්මික අපසන්දන සඳහා වන ධාරණ සීමා

| *අංකය* | *නිර්ණකයන්* | *ඒකක හා සීමා* | *ධාරණ සීමා අගයන්* |
|---|---|---|---|
| 01. | අවලම්භිත මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 02. | අවලම්භිත මුළු ඝන ද්‍රව්‍යවල අංශුවක ප්‍රමාණය | මයික්‍රෝ මීටර්, උපරිම | 850 |
| 03. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | | 6.0-8.5 |
| 04. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$ දී දින 5ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^0$ දී දින 3ක් තුල -$BOD_3$) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 30 |
| 05. | මුදාහැරීමේ දී උෂ්ණත්වය | සෙ. අංශක, උපරිම | පිටාර මුඛයේ සිට මීටර් 15ක් ඇතුලත ජල මාර්ගයේ ඕනෑම කොටසක දී සෙ. $40^0$ ට වැඩි නොවිය යුතුය. |
| 06. | තෙල් වර්ග සහ ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 10 |
| 07. | පිනෝලික සංයෝග (පිනෝලික OH ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1 |

| | | | |
|---|---|---|---|
| 08. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 250 |
| 09. | වර්ණය | තරංග ආයාම පරාසය<br>436 නැනෝමීටර්<br>(කහ වර්ණ පරාසය)<br>525 නැනෝමීටර්<br>(රතු වර්ණ පරාසය)<br>620 නැනෝමීටර්<br>(නිල් වර්ණ පරාසය) | <br>7 මීටරයට<br><br>5 මීටරයට<br><br>3 මීටරයට |
| 10. | ද්‍රවණය වූ පොස්පේට (P ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5 |
| 11. | සම්පූර්ණ ජෙල්ඩාල් නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 150 |
| 12. | ඇමෝනීය නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 13. | සයිනයිඩ (CN ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 14. | සම්පූර්ණ ශේෂ ක්ලෝරීන් | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 15. | ෆ්ලෝරයිඩ් (F ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 16. | සල්ෆයිඩ් (S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 17. | ආසනික් (As ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 18. | කැඩ්මියම් (Cd ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.1 |
| 19. | සම්පූර්ණක්‍රෝමියම් (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.5 |
| 20. | ෂඩ් සංයුජ ක්‍රෝමියම් ($Cr^{6+}$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.1 |
| 21. | තඹ (Cu ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 22. | යකඩ (Fe ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 23. | ඊයම් (Pb ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.1 |
| 24. | රසදිය (Hg ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.0005 |
| 25. | නිකල් (Ni ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 26. | සෙලිනියම් (Se ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.05 |
| 27. | සින්ක් (Zn ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 28. | පලිබෝධ නාශක | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.005 |
| 29. | ක්ෂාලක ද්‍රව්‍ය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5 |
| 30. | මළ අපද්‍රව්‍ය බැක්ටීරියා (කෝලි ආකාර) | ඉතා ආසන්න සංඛ්‍යාව/<br>ඩෙසි ලීටර්, උපරිම | 40 |
| 31. | විකිරණශීලි ද්‍රව්‍ය<br><br>(අ) ඇල්ෆා විමෝචක<br><br>(ආ) බීටා විමෝචක | <br><br>මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම<br><br>මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම | <br><br>$10^{-8}$<br><br>$10^{-7}$ |

1. වන සටහන : වර්ණය සහ අප්‍රසන්න දූර්ගන්ධය ඉවත් කිරීමට හැකිතාක් දුරට උත්සාහ කළ යුතුය.

2. වන සටහන : මෙම අගයන් පදනම් වී ඇත්තේ අපසන්දන ජලය, ප්‍රතිග්‍රහණය කරන ජලය පරිමා 8 කින් තනුක කිරීම මතය, තනුකකරණය 8 වරකට වඩා අඩුනම් තනුකරණය 8 වරක් වනලෙස ධාරණ සීමාවන් සැකසිය යුතු වේ.

3. වන සටහන : යම් විශේෂිත කර්මාන්තයක් සඳහා නිශ්චිත කර්මාන්ත ප්‍රමිති දැනුම් දෙනු ලැබ ඇති විට, එකී කර්මාන්තය සම්බන්ධයෙන් පොදු ප්‍රමිති අදාළ නොවේ.

4. වන සටහන : පලිබෝධ නාශක අගයන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ අගයන්ට අනුකූළ වන ලෙස සකසා ඇත.

## *II වන ලැයිස්තුව*

වාරිමාර්ග කටයුතු සඳහා භාවිතා කරනු ලබන භූමි වලට මුදාහරින
කාර්මික අපසන්දන සඳහා ධාරණ සීමා

| *අංකය* | *නිර්ණකයන්* | *ඒකක හා සීමා* | *ධාරණ සීමා* |
|---|---|---|---|
| 01. | ද්‍රවණය වූ මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2100 |
| 02. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 5.5 - 9.0 |
| 03. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$ දී දින 5 ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^0$ දී දින 3ක් තුල -$BOD_3$) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 250 |
| 04. | තෙල් වර්ග සහ ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 10 |
| 05. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 400 |
| 06. | ක්ලෝරයිඩ (CI ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 600 |
| 07. | සල්ෆේට ($SO_4$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1000 |
| 08. | බෝරෝන් (B ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 09. | ආසනික් (As ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 10. | කැඩ්මියම් (Cd ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 11. | සම්පූර්ණ ක්‍රෝමියම් (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 12. | ඊයම් (Pb ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 13. | රසදිය (Hg ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.01 |
| 14. | සෝඩියම් අවශෝෂණ අනුපාතය (SAR) | - | 10-15 |
| 15. | ශේෂ සෝඩියම් කාබනේට් (RSC) | මෞල/ලීටර්, උපරිම | 2.5 |
| 16. | විද්‍යුත් සන්නායකතාවය | මයික්‍රො සීමන්ස්/සෙ.මී, උපරිම | 2250 |
| 17. | මළ අපද්‍රව්‍ය බැක්ටීරියා (කෝලි ආකාර) | ඉතා ආසන්න සංඛ්‍යාව/ ඩෙසි ලීටර් උපරිම | 40 |
| 18. | තඹ (Cu ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 19. | සයිනයිඩ් (CN ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 20. | විකිරණශීලී ද්‍රව්‍ය | | |
| | (අ) ඇල්ෆා විමෝචක | මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම | $10^{-9}$ |
| | (ආ) බීටා විමෝචක | මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම | $10^{-8}$ |

*පසේ ස්වභාවය අනුව අපසන්දන උරාගැනීමේ ධාරිතාවයන්*

| පසේ ස්වභාවය | නිර්දේශිත කාර්මික අපසන්දන ධාරිතාවය<br>දිනකට හෙක්ටයාරයට ඝණ මීටර් |
|---|---|
| වැලි පස | 225 - 280 |
| වැලි ලෝම පස | 170 - 225 |
| ලෝම පස | 110 - 170 |
| මැටි ලෝම පස | 53 - 110 |
| මැටි පස | 35 - 55 |

## *III වන ලැයිස්තුව*

වෙරළබඩ ප්‍රදේශවල මුදාහරින කාර්මික හා ගෘහස්ථ අපසන්දන සඳහා ධාරන සීමා

| *අංකය* | *නිර්ණකයන්* | *ඒකක හා සීමා* | *ධාරණ සීමා* |
|---|---|---|---|
| 01. | මුළු අවලම්භිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 150 |
| 02. | අංශු ප්‍රමාණය -<br>(අ) පාවෙන ඝන ද්‍රව්‍ය<br>(ආ) තැන්පත් වන ඝන ද්‍රව්‍ය | <br>මිලි මීටර්, උපරිම<br>මයික්‍රොමීටර්, උපරිම | <br>3.0<br>850 |
| 03. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 5.5 - 9.0 |
| 04. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$ දී දින 5ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^0$ දී දින 3ක් තුල -$BOD_3$ ) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 100 |
| 05. | මුදාහැරීමේ දී උෂ්ණත්වය | සෙ. අංශක, උපරිම | මුදාහරින ස්ථානයේ දී සෙ. $45^0$ |
| 06. | තෙල් වර්ග සහ ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 20 |
| 07. | පිනෝලික සංයෝග (ෆීනෝලික OH ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5 |
| 08. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 250 |
| 09. | සම්පූර්ණ ශේෂ ක්ලෝරීන් | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 10. | ඇමෝනීය නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 11. | සයිනයිඩ (CN ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 12. | සල්ෆයිඩ් (S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 13. | ක්ලෝරයිඩ් (F ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 15.0 |
| 14. | ආසනික් (As ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 15. | කැඩ්මියම් (Cd ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 16. | සම්පූර්ණ ක්‍රෝමියම් (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 17. | ෂඩ් සංයුජ ක්‍රෝමියම් ($Cr^{6+}$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 18. | තඹ (Cu ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |

| | | | |
|---|---|---|---|
| 19. | ඊයම් (Pb ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 20. | රසදිය (Hg ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.01 |
| 21. | නිකල් (Ni ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 22. | සෙලීනියම් (Se ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.1 |
| 23. | සින්ක් (Zn ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 24. | පලිබෝධ නාශක | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.005 |
| 25. | කාබනික පොස්පරස් සංයෝග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 26. | ක්ලෝරිනීකෘත හයිඩ්‍රොකාබන (Cl ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.02 |
| 27. | මළ අපද්‍රව්‍ය බැක්ටීරියා (කෝලි ආකාර) | ඉතා ආසන්න සංඛ්‍යාව/ඩෙසි ලීටර්, උපරිම | 60 |
| 28. | විකිරණශීලි ද්‍රව්‍ය<br>(අ) ඇල්ෆා විමෝචකයන්<br>(ආ) බීටා විමෝචකයන් | <br>මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම<br>මයික්‍රෝ කියුරි/මිලි ලීටර්, උපරිම | <br>$10^{-8}$<br>$10^{-7}$ |

1 වන සටහන - වර්ණය සහ අප්‍රසන්න දුර්ගන්ධය ඉවත් කිරීමට හැකිතාක් දුරට උත්සාහ ගත යුතුය.

2 වන සටහන - මෙම අගයන් පදනම් වී ඇත්තේ අපසන්දන ජලය, ප්‍රතිග්‍රහණය කරන ජලය පරිමා 8 කින් තනුක කිරීම මතයි. තනුකරණය 8 වරකට වඩා අඩුනම් තනුකරණය 8 වරක් වන ලෙස ධාරණ සීමාවන් සැකසිය යුතු වේ.

## *IV වන ලැයිස්තුව*

*රබර් කර්මාන්තශාලාවලින් රට අභ්‍යන්තර ජලාශවලට මුදාහරින අපසන්දන සඳහා ධාරණ සීමා*

| *අංකය* | *නිර්ණකයන්* | *ඒකක හා සීමා* | *ධාරණ සීමා* | |
|---|---|---|---|---|
| | | | **1 වන වර්ගයේ කර්මාන්ත ශාලා* | ***11 වන වර්ගයේ කර්මාන්ත ශාලා* |
| 01. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | | 6.5 - 8.5 | 6.5 - 8.5 |
| 02. | මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 100 | 100 |
| 03. | මුළු ඝන ද්‍රව්‍ය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1500 | 1000 |
| 04. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$ දී දින 5ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^0$ දී දින 3ක් තුල -$BOD_3$ ) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 60 | 50 |
| 05. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 400 | 400 |
| 06. | මුළු නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 300 | 60 |
| 07. | ඇමෝනීය නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 300 | 40 |
| 08. | සල්ෆයිඩ (S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 | 2.0 |

*I වන වර්ගයේ කර්මාන්ත ශාලා - රබර් කිරි සාන්ද්‍රණ
**II වන වර්ගයේ කර්මාන්ත ශාලා - සම්මත ලංකා රබර්, ක්‍රේප් රබර් සහ දුම්ගැසූ දාර රොටි

1 වන සටහන - හැකිතරම් දුරට වර්ණය හා අප්‍රසන්න දුර්ගන්ධය ඉවත් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය.

2 වන සටහන - මෙම අගයන් පදනම් වී ඇත්තේ අපසන්දන ජලය, ප්‍රතිග්‍රහණය කරන ජලය පරිමා 8 කින් තනුක කිරීම මතයි. තනුකරණය 8 වරකට වඩා අඩුනම් තනුකරණය 8 වරක් වන ලෙස ධාරණ සීමාවන් සැකසිය යුතු වේ.

## *V වන ලැයිස්තුව*

පේෂ කර්මාන්තශාලාවලින් රට අභ්‍යන්තර ජලාශවලට මුදාහරින අපසන්දන සඳහා ධාරණ සීමා

| *අංකය* | *නිර්ණකයන්* | *ඒකක හා සීමා* | *ධාරණ සීමා* |
|---|---|---|---|
| 01. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 6.5 - 8.5 |
| 02. | මුදාහැරීමේ උෂ්ණත්වය | සෙ අංශක, උපරිම | 40 |
| 03. | මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 04. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$ දී දින 5ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^0$දී දින 3ක් තුල -$BOD_3$ ) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 60 |
| 05. | වර්ණය | **තරංග ආයාම පරාසය**<br>436 නැනෝමීටර් (කහ වර්ණ පරාසය)<br>525 නැනෝමීටර් (රතු වර්ණ පරාසය)<br>620 නැනෝමීටර් (නිල් වර්ණ පරාසය) | <br>7 මීටරයට<br>5 මීටරයට<br>3 මීටරයට |
| 06. | තෙල් වර්ග සහ ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 10 |
| 07. | පීනෝලික සංයෝග (පීනෝලික OH ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 08. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 250 |
| 09. | සල්ෆයිඩ් (S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 10. | සම්පූර්ණ ක්‍රෝමියම් (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 11. | ෂඩ් සංයුජ ක්‍රෝමියම් ($Cr^{6+}$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.5 |
| 12. | තඹ (Cu ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 13. | සින්ක් (Zn ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 14. | ඇමෝනිය නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 60 |
| 15. | ක්ලෝරයිඩ් (CI ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 70 |

1. වන සටහන : හැකිතරම් දුරට වර්ණය හා අප්‍රසන්න දුර්ගන්ධය ඉවත් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය.

2. වන සටහන : මෙම අගයන් පදනම් වී ඇත්තේ අප්‍රසන්දන ජලය, ප්‍රතිග්‍රහණය කරන ජලය පරිමා 8 කින් තනුක කිරීම මතයි. තනුකරණය 8 වරකට වඩා අඩුනම් තනුකරණය 8 වරක් වනලෙස ධාරණ සීමාවන් සැකසිය යුතු වේ.

## *VI වන ලැයිස්තුව*

සම් පදම් කිරීමේ කර්මාන්ත ශාලාවලින් මුදාහරිනු ලබන අපසන්දන සඳහා ධාරණ සීමා

| අංකය | නිර්ණකයන් | ඒකක හා සීමා | ධාරණ සීමා | |
|---|---|---|---|---|
| | | | රට අභ්‍යන්තර ජලාශවලට මුදා හැරීමේ දී | වෙරළ ප්‍රාදේශවලට මුදා හැරීමේ දී |
| 01. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 5.5 - 9.0 | 5.5 - 9.0 |
| 02. | මුළු අවලම්බිත ඝණ ද්‍රව්‍ය ප්‍රමාණය | මිලිග්‍රෑම්/ ලීටර්, උපරිම | 100 | 150 |
| 03. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^{0}$ දී දින 5ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^{0}$ දී දින 3ක් තුල - $BOD_3$) | මිලිග්‍රෑම්/ ලීටර්, උපරිම | 60 | 100 |
| 04. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ ලීටර්, උපරිම | 250 | 300 |
| 05. | වර්ණය | තරංග ආයාම පරාසය<br>436 නැනෝ මීටර් (කහ වර්ණ පරාසය)<br>525 නැනෝ මීටර් (රතු වර්ණ පරාසය)<br>620 නැනෝ මීටර් (නිල් වර්ණ පරාසය) | <br>7 මීටරයට<br>5 මීටරයට<br>3 මීටරයට | <br>-<br>-<br>- |
| 06. | ක්ෂාරීයත්වය (as $CaCO_3$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 750 | |
| 07. | ක්ලෝරයිඩ් (Cl ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1,000 | |
| 08. | ෂඩ් සංයුජ ක්‍රෝමියම් ($Cr^{+6}$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.5 | 0.5 |
| 09. | සම්පූර්ණ ක්‍රෝමියම් (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 | 2.0 |
| 10. | තෙල් වර්ග සහ ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 10 | 20 |
| 11. | පිනෝලික සංයෝග (පිනෝලික OH ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 | 5.0 |
| 12. | සල්ෆයිඩ ( S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 | 5.0 |

1 වන සටහන - හැකිතරම් දුරට වර්ණය හා අප්‍රසන්න දුර්ගන්ධය ඉවත් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය.

2 වන සටහන - මෙම අගයන් පදනම් වී ඇත්තේ අපසන්දන ජලය, ප්‍රතිග්‍රහණය කරන ජලය පරිමා 8කින් තනුක කිරීම මතයි. තනුකරණය 8 වරකට වඩා අඩුනම් තනුකරණය 8 වරක් වන ලෙස ධාරණ සීමාවන් සැකසිය යුතු වේ.

## *VII* වන ලැයිස්තුව

පොදු මළ පිරිපහදු පද්ධති වෙත මුදාහරිනු ලබන කාර්මික අපසන්දන සඳහා වන ධාරණ සීමා

| අංකය | නිර්ණකයන් | ඒකක හා සීමා | ධාරණ සීමා |
|---|---|---|---|
| 1. | අවලම්බිත මුළු ඝණ ද්‍රව්‍ය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 500 |
| 2. | පරිසර උෂ්ණත්වයේ දී pH අගය | - | 5.5 - 10.0 |
| 3. | උෂ්ණත්වය | සෙ. අංශක, උපරිම | 45 |
| 4. | ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. $20^0$ දී දින 5ක් තුල - $BOD_5$ හෝ සෙ. $27^0$දී දින 3ක් තුල -$BOD_3$ ) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 350 |
| 5. | රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 850 |
| 6. | මුළු ජෙල්ඩාල් නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 500 |
| 7. | නිර්බන්ධිත ඇමෝනියා (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 8. | ඇමෝනීය නයිට්‍රජන් (N ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 9. | සයනයිඩ් (CN ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2 |
| 10. | මුළු ශේෂ ක්ලෝරීන් | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 11. | ක්ලෝරයිඩ් (Cl ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 900 |
| 12. | ෆ්ලෝරයිඩ (F ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 20 |
| 13. | සල්ෆයිඩ (S ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 14. | සල්පේට ($SO_4$ ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1,000 |
| 15. | ආසනික් (As ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 16. | කැඩ්මියම් (Cd ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 17. | සම්පූර්ණ ක්‍රෝමියම් (Cr ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 2.0 |
| 18. | තඹ (Cu ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 19. | ඊයම් (Pb ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 1.0 |
| 20. | රසදිය (Hg ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.005 |
| 21. | නිකල් (Ni ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 3.0 |
| 22. | සෙලිනියම් (Se ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.05 |
| 23. | සින්ක් (Zn ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5.0 |
| 24. | පලිබෝධනාශක | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 0.2 |
| 25. | ක්ෂාලක ද්‍රව්‍ය | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 50 |
| 26. | ෆිනෝලික සංයෝග (ෆිනෝලික OH ලෙස) | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 5 |
| 27. | තෙල් වර්ග හා ග්‍රීස් වර්ග | මිලිග්‍රෑම්/ලීටර්, උපරිම | 30 |
| 28. | විකිරණශීලී ද්‍රව්‍ය :<br>ඇල්ෆා විමෝචක<br>බීටා විමෝචක | <br>මයික්‍රෝ කියුරි/ලීටර්, උපරිම<br>මයික්‍රෝ කියුරි/ලීටර්, උපරිම | <br>$10^{-8}$<br>$10^{-7}$ |

සටහන් : පහත කොන්දේසි වලට අනුකූලව කටයුතු කල යුතුය.

දුස්‍රාවීතාවය වැඩි කාර්මික අපසන්දන මුදාහැරීමට අවසර නැත.

කැල්සියම් කාබයිට් රොන් බොර මුදා නොහැරිය යුතුය.

ගිනිගන්නා සුළු වාෂ්ප ජනනය කරන ද්‍රව්‍ය අඩංගු නොවිය යුතුය.

II වන උපලේඛනය

(රෙගුලාසි අංක -05)

" අ " ආකෘතිය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

23 අ වගන්තිය යටතේ නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය / බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය

කාණ්ඩය : ඉල්ලුම් පත්‍ර අංකය :

වර්ගය : දිනය :

කර්මාන්තයේ නම :

කර්මාන්තයේ වර්ගය හෙවත් ප්‍රකාරය / යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කිරීම/ කොටස් එක්තැන් කිරීම/ නියම ලෙස මිශ්‍ර කිරීම/ නැවත ඇසිරීම/ ක්‍රියාවලි/ වෙනත් ( නිශ්චිතව සඳහන් කරන්න).

ඉල්ලුම්කරුගේ නම :

ලිපිනය :

දුරකථන අංකය :

1. කර්මාන්තය සම්බන්ධ සාමාන්‍ය විස්තර:

1.1 කර්මාන්තයේ ස්වභාවය :

1.2 කර්මාන්තය පිහිටි ස්ථානය :

(පිහිටීම සම්බන්ධ සිතියමක් සහ මාර්ග සළකුණු සහිතව එම ස්ථානයට පැමිණිය හැකි මාර්ගය පැහැදිලි කරන සටහනක් යා කරන්න).

ලිපිනය :

1.3 පළාත් පාලන ආයතනයේ නම :

1.4 මෙම පිහිටීම ඇත්තේ අනුමත කාර්මික කළාපයක් තුළ ද ?

1.5 මූලික ආයෝජනය ප්‍රමාණය :

දේශීය මුදල් :

විදේශීය මුදල් :

1.6 නිෂ්පාදන ආරම්භ කරන ලද දිනය:

1.7 දිනකට වැඩමුර සංඛ්‍යාව සහ වේලාවන් :

1.8 එක් එක් වැඩමුරය තුල සේවය කරන සේවක සංඛ්‍යාව :

1.9 කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය සහ පිහිටුවීම සඳහා ප්‍රාදේශීය සහා හෝ රාජ්‍ය ආයතන වලින් ලබාගන්නා ලද අවසරය සම්බන්ධ ලේඛනයක් ඃ (කරුණාකර ඡායා පිටපත් අමුණන්න)

| | *නම* | *අවලංගු වන දිනය* | *නිකුත් කරන ලද දිනය* |
|---|---|---|---|
| (අ) | | | |
| (ආ) | | | |
| (ඇ) | | | |
| (ඈ) | | | |
| (ඉ) | | | |

1.10. කි. මී. 5ක් අර්ධ විශ්කම්භය තුළ ප්‍රදේශයේ ඉඩම් පාවිච්චිය නේවාසික/ වාණිජ / කෘෂිකාර්මික/ විවෘත අවකාශයක්/ප්‍රසිද්ධ ප්‍රදේශයක්/ වගුරු බිම්/ ලවණ සහිත වගුරු බිම්/ කඩොලාන/ ස්වභාවික වනාන්තර/ වෙනත් (සඳහන් කරන්න). :

1.11. කී. මී. 2ක අර්ධ විෂ්කම්භයක් තුළ දැනට පවතින කර්මාන්ත /ආයතන/කෘෂිකාර්මික බිම් සම්බන්ධව ලේඛනයක් :

1.12. ප්‍රතිකර්ම පද්ධතියක් සඳහා ඇති ඉඩ ප්‍රමාණය :

2. නිෂ්පාදන ක්‍රියාවලිය :

2.1. නිෂ්පාදනය කරන ප්‍රධාන භාණ්ඩවල ලේඛනයක් සහ ධාරිතාවයන් :

2.2 අතුරු නිෂ්පාදන ලැයිස්තුව :

2.3 ක්‍රියාවලි විස්තර :

2.3.1 භාවිතා කරන ක්‍රියාවලි සම්බන්ධව කෙටි විස්තරයක් (ක්‍රියාවලි ප්‍රවාහ රූප සටහන අමුණන්න). :

2.3.2 භාවිතා කරන අමුද්‍රව්‍ය :
(නිෂ්පාදනයේ සෑම අවස්ථාවකදීම දිනකට අමුද්‍රව්‍ය භාවිතා කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න).

2.3.3 භාවිතා කරන රසායන ද්‍රව්‍ය :

| රසායන ද්‍රවයේ නම : | වෙළෙඳ නාමය : | දිනකට පාවිච්චි කරන ප්‍රමාණය : (කි. ග්‍රෑම් වලින් ) |
|---|---|---|

2.3.4 ඕනෑම හානිකර/ විෂදායක / ගිනිගන්නා සුළු/ පුපුරන සුළු ද්‍රව්‍ය ප්‍රවාහනය සහ හැසිරීම සම්බන්ධව යොදා ඇති පූර්වෝපායයන් :

2.3.5 හානිකර /විෂදායක/ගිනිගන්නා සුළු/පුපුරන ද්‍රව්‍ය සඳහා ගබඩා පහසුකම් :

2.3.6 ගිනි නිවීම සඳහා ප්‍රමාණවත් උපකරණ ඔබ ලඟ තිබේ ද?

2.3.7 එසේ නම් එබඳු උපකරණ සම්බන්ධ විස්තර :

3. ජලය

3.1 ජලය - අවශ්‍යතාවය :
නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා : දිනකට ඝනමීටර් :
සිසිල් කිරීම සඳහා : දිනකට ඝන මීටර් :
සේදීම සඳහා දිනකට : දිනකට ඝන මීටර් :
ගෘහස්ථමය ක්‍රියාවලි සඳහා : දිනකට ඝන මීටර් :

3.2 ජලය ලබා ගන්නා ප්‍රභවයන් :
1. පොදු ජල සැපයුම.
2. භූගත ජලය (ලිං, උල්පත්).
3. මතුපිට ජලය (ඇලදොළ, ගංගා).

3.3 සම්පූර්ණ දෛනික මුදාහැරීම - දිනකට ඝන මීටර් :

3.4 මුදාහැරීමේ ක්‍රමය ඃ විවෘත ඇළමාර්ග / නල මාර්ග මගින්/ සංවෘත කානු/ වෙනත්.

3.5 අපවිත්‍ර ජලය මුදාහරින අවසන් ස්ථානය ඃ කෘෂිකාර්මික භූමියක් / වගුරු බිමක් / කැත කුණු බැස යන කාණුවක් / වැවක්/ ගංගාවක්/ ඇලක්/ ගං මෝයක්/ මුහුදට/ වෙනත් :

3.6 මුදාහරින වෙනත් විශේෂ විෂදායක ද්‍රව්‍ය මොනවාද ? (ස්වභාවය සහ සාන්ද්‍රණය ) සඳහන් කරන්න :
උදා :- අකාබනික සහ කාබනික ද්‍රව්‍ය පලිබෝධනාශක ඇතුලත්ව, කාබනික ක්ලෝරීන් සංයෝග, බර ලෝහ යනාදිය).

3.7 අපවිත්‍ර ජලය ප්‍රතිකර්මයට භාජනය කරන ක්‍රම (ප්‍රතිකර්ම ක්‍රියාවලිය සම්බන්ධ රූප සටහනක් අඩංගු කල යුතුයි). :

3.8. ප්‍රතිකර්මයට පෙර සහ පසු, අපවිත්‍ර ජලයේ ආවේණික ගුණාංග වර්තා කිරීමට යොදා ඇති ක්‍රම :

3.9 ජලය නැවත පාවිච්චි කරන්නේ නම් නැතහොත් චක්‍රීකරණයට භාවිතා කරන්නේ නම්, ඒ සම්බන්ධ විස්තර :

4. ඝණ අපද්‍රව්‍ය

4.1 ඝන අපද්‍රව්‍යවල ස්වභාවය සහ වර්ගය :

4.2 ඝන අපද්‍රව්‍යවල සම්පූර්ණ ප්‍රමාණය දිනකට කි.ග්‍රෑම් :

4.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම - නාගරික එකතු කිරීමේ ක්‍රමය/ බිම් පිරවීම/ දහනය/කොම්පෝස්ට් කිරීම/ විකිණීම / චක්‍රීකරනය

5. වායුගෝලීය මෝචනයන් :

වායුගෝලයට කිසියම් මෝචනය කිරීමක් ඇද්ද ඔව්/නැත. එසේ " තිබේනම් " පහත සඳහන් දෑ සම්පූර්ණ කරන්න

5.1. සිදුවිය හැකි මෝචනයන් :

අ. නයිට්‍රජන් වල ඔක්සයිඩ් වර්ග :

ආ. සල්ෆර් වල ඔක්සයිඩ් වර්ග :

ඇ. දුවිලි සහ දැලි :

ඈ. වෙනත් ද්‍රව්‍යයක් :

5.2. දුම් කවුළු / චිමිනි සංඛ්‍යාව :

උස :

6. ඔබේ කර්මාන්තයේ දුගඳ සම්බන්ධ ප්‍රශ්ණ ඇති කරනවාද ? :

එසේ "තිබේනම්" :

ප්‍රභවය :

මැඩ පවත්වා ගත හැකි ක්‍රම

7. ශබ්ද දූෂණය :

7.1. ඔබේ කර්මාන්තයෙන් ශබ්ද දූෂණයක් ඇති කෙරේ ද ? ඔව්/ නැත.

7.2. එසේ "තිබේ නම්" ප්‍රභවය :

මැඩ පවත්වා ගතහැකි ක්‍රම :

8. බලශක්ති අවශ්‍යතාවයන් :

8.1. සම්පූර්ණ බලශක්ති පරිභෝජනය :

අ. උත්පාදන යන්ත්‍රයක් මගින් :

ආ. පොදු විදුලි සැපයුම් මගින් :

8.2 කර්මාන්තයේ භාවිතා කරන යන්ත්‍රවල විස්තර සහ ඒවායේ අශ්වබල ප්‍රමාණයන් :

8.3. භාවිතා කරන ඉන්ධන වර්ගය :

අ. භාවිතා කරන්නේ කුමක් සඳහා ද :

ආ. දෛනික පරිභෝජනය :

9. චක්‍රීකරණය / නැවත පාවිච්චිය :

9.1 ඕනෑම අපද්‍රව්‍යයක් නැවත පාවිච්චිය සඳහා ලබාගත හැකි ප්‍රමාණය නිශ්චිතව සඳහන් කරන්න :

10. කර්මාන්තය පුළුල් කිරීම :

අනාගතයේ දී කර්මාන්තය පුළුල් කිරීම ගැන ඔබේ සැලසුම් විස්තර කරන්න. යෝජිත පුළුල් කිරීමේ දී නිෂ්පාදන ක්‍රියාවලිය. අමුද්‍රව්‍ය පාවිච්චිය සහ නිමි භාණ්ඩ වෙනස් කිරීමට බලාපොරොත්තු වන්නේ දැයි යන වග සඳහන් කරන්න.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික වෙමි. මෙහි සඳහන් තොරතුරක් ව්‍යාජ හෝ අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත්, මගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන බවත්, බලපත්‍රය නිකුත් කර ඇත්නම් එය අවලංගු කරන බවත් මම හොඳින් දන්නෙමි.

———————,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

## රසායනික කර්මාන්ත වලින් අවශ්‍ය අමතර තොරතුරු

පහත සඳහන් පරිදි සවිස්තර තොරතුරු සැපයිය යුතු වේ.

1. පහසුකම් සහිත ඉඩමේ සිට සැතපුම් භාගයක් ඉක්මවා පැතිර පවත්නා අපසන්දන මුදාහැරීමේ ස්ථාන, ළිං, උල්පත් හා වෙනත් මතුපිට ජල මාර්ග සහ බීමට ගන්නා ළිංවල පිහිටීම චිත්‍රයෙන් දැක්වෙන දළ සිතියමක්.
2. පහත සඳහන් (i) හා (ii) ආශ්‍රිතව එකී පහසුකම් ඇති ස්ථානයේ භාවිතා කරනු ලබන ක්‍රියාමාර්ග ව්‍යුහයන් සහ උපකරණ සම්බන්ධ විස්තර ඃ
   (i) රසායන ද්‍රව්‍ය ප්‍රවාහනයේ දී සහ බෑමේ ක්‍රියාවන්හිදී අනතුරු වළක්වාලීම,
   (ii) රසායන ද්‍රව්‍යවලට පුද්ගලයන් අධික ලෙස අනාවරණය වීම වැළැක්වීම, (ආරක්ෂක ඇඳුම් ආදිය )

3. පහත සඳහන් කරුණු ගැන විස්තර -
   (i) රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම නිසා හදිසි ගිනි ගැනීම් වළක්වාලීම සම්බන්ධයෙන් පූර්වෝපායයන්
   (ii) ප්‍රයෝජනය සඳහා ඇති ගිනි නිවන උපකරණ
   (iii) ගිනි නිවීම ගැන පුද්ගලයින් පුහුණු කිරීම

4. කාර්මික ක්‍රියාවලියේ පාවිච්චියට පෙර රසායන ද්‍රව්‍ය ප්‍රමාණය ගබඩා කිරීමේ ක්‍රමය ගැන විස්තරයක්.
5. පාවිච්චි කරන ලද රසායන ද්‍රව්‍ය ආපසු ලබාගැනීමට හැකි නම්, එකී ක්‍රමය ගැන විස්තරයක්,

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.

බලපත්‍ර ඉල්ලුම්පත් අංකය :
කාණ්ඩය :
වර්ගය :

1. ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය :
2. අදාල මානක සැළසුම්, වාර්තා සහ වෙනත් ලියකියවිලි ලැබුනේ ද :
3. අමතර තොරතුරු ඉල්ලා සිටියේ නම්. එවැනි ඉල්ලීම් සම්බන්ධ විස්තර :
4. වෙනත් ආයතනයක නිරීක්ෂණයන් ඉල්ලා සිටියේ නම්, එවැනි ඉල්ලීම් සම්බන්ධ විස්තර :
5. බලපත්‍ර සඳහා අවසර දුන්නේද යන වග ඃ ඔව්/නැත :
6. බලපත්‍ර සඳහා අවසර දුන්නේ නම්,
   (අ) බලපත්‍රයේ අංකය :
   (ආ) බලපත්‍රයේ දිනය :
   (ඇ) වලංගු කාලය :
   (ඈ) අවලංගු වන දිනය :
   (ඉ) අදාල කොන්දේසි අමුණා ඇත (ඇත්නම්) :

7. බලපත්‍රය ප්‍රතික්ෂේප කලේ නම් ප්‍රතික්ෂේප කිරීමට හේතු :

————,
අවසර දෙන නිලධාරියාගේ අත්සන සහ තනතුර.

දිනය :————.

(රෙගුලාසි අංක - 06)

"ආ" ආකෘතිය

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23ආ වගන්තිය යටතේ නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැර ලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

...........................................ප්‍රාදේශීය සභා/නගර සභා/මහ නගර සභා බල ප්‍රදේශ තුළ ...........................................පිහිටි ..........................................වෙත අංක .......................2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ව) නියෝග සහ අංක.......................පාරිසරික (ශබ්ද පාලන) නියෝග 01 මගින් නියමිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව, එකී අපද්‍රව්‍ය/මුදාහැරීම්/තැන්පත් කිරීම සහ හෝ වායු මෝචනයක්/කම්පනයක්/ශබ්දය පිට කිරීම සඳහා මෙයින් බලය පවරමි/පවරමු.

මීට ප්‍රථමයෙන් ප්‍රතික්ෂේප කිරීමක් හෝ අත් හිටුවීමක් නොවීනම්, මෙම බලපත්‍රය....................... සිට....................... දක්වා වලංගු වේ.

මෙම බලපත්‍රය පසුපිටෙහි සඳහන් පොදු නියම හා කොන්දේසි වලට සහ විශේෂයෙන් පහත සඳහන් කර ඇති අමතර නියම හා කොන්දේසි වලට යටත් වන්නේය.

1.
2.
3.
4.

__________,
සභාපති/අධ්‍යක්ෂ ජනරාල්/බලයලත් නිලධාරී,
මධ්‍යම පරිසර අධිකාරිය.

දිනය :__________.

***පොදු නියම හා කොන්දේසි***

1. බලපත්‍රය එහි සඳහන් නිශ්චිත කාලය සඳහා වලංගු විය යුතුය. එසේ වුව ද බලපත්‍රය, එය නිකුත් කරන ලද දින සිට අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වලංගු විය යුතුය. බලපත්‍රය වලංගු කාලය අවසන් වීමට තුන්මසකට පළමු බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

2. අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයෙකු, කවර හෝ වේලාවක නිකුත් කරන ලද බලපත්‍රය පිලිබඳ වූ පරිශ්‍රයට ඇතුළුව, යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් පරීක්ෂා කිරීමට හා සෝදිසි කිරීමට බලපත්‍ර අයිතිකරු විසින් ඉඩලබා දීම කළ යුතු වේ, තව ද,

 (අ) එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් හෝ ඒ මගින් මෝචනය කරනු ලබන, මුදා හරිනු ලබන හෝ තැන්පත් කරනු ලබන යම් දූෂණ කාරකයන්ගේ ආදර්ශ ගැනීමට

 (ආ) එවැනි උපකරණයකින් හෝ කාර්මික පිරියතෙන් මෝචන කිරීමට, මුදාහැරීමට හෝ තැන්පත් කිරී මට අදාළ වූ පොත්පත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීමට,

 (ඇ) එවැනි උපකරණයක හෝ කාර්මික පිරියතේ ඡායාරූප ගැනීමට හෝ අවශ්‍ය යයි තමා සලකන, එම පරීක්ෂණය පවත්වාගෙන යැමේ දී දක්නට ලැබෙන යම් පොත්පත්වල වාර්තාවල හෝ ලේඛණවල පිටපත් ගැනීමට සහ

 (ඈ) එම පරිශ්‍රය තුළ හෝ ඒ මත පවත්වා ගෙන යනු ලබන එම වෙළඳාමෙහි, කර්මාන්තයෙහි හෝ ක්‍රියාවලියෙහි පාවිච්චි කරනු ලබන යම් ඉන්ධනයක, වස්තුවක හෝ ද්‍රව්‍යයක ආදර්ශ ගැනීමට

බලපත්‍රය අයිතිකරු විසින් ඉඩ ලබාදීම කළ යුතු වේ.

3. පහත සඳහන් දේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් වරින්වර පනවනු ලබන ඕනෑම නියමයකට, බලපත්‍ර අයිතිකරු එකඟ විය යුතු වේ.

(අ) පරිසර දූෂණය සහ උපද්‍රව අඩු කිරීමේ අදහසින් නිෂ්පාදන ක්‍රියාවලියෙහි දී යම් තාක්ෂණික ක්‍රම හෝ සවි කිරීම් ප්‍රයෝජනයට ගැනීම/බඩු බාහිරාදිය, ද්‍රව්‍ය, ඉන්ධන සහ අපද්‍රව්‍ය පාලනය කිරීම හා ගබඩා කිරීම, සහ

(ආ) පරිසර දූෂණය සහ උපද්‍රව වැළැක්වීම හෝ අඩුකිරීම සඳහා ගනු ලබන ඕනෑම අමතර තාක්ෂණික පියවරවල්.

4. පහත සඳහන් කාර්යයන් ඇතුළත්ව, පරිසරය ආරක්ෂා කිරීමට අවශ්‍ය යැයි අධිකාරිය සලකනු ලබන පරිසර දූෂණය පිරික්සීමේ කාර්ය හෝ වෙනත් ක්‍රියා ඉටුකරන බවට බලපත්‍රය අයිතිකරු සහතික විය යුතුවේ.

(අ) මිණුම් ගණනය, ආදර්ශ ලේඛනගත කිරීම අනුව දූෂණයට සම්බන්ධව සත්‍ය මට්ටම් සහ අවදානමට අනාවරණය වීමට ඇති ඉඩකඩ නිර්ණය කිරීම ;

(ආ) දත්තයන් වර්ග කිරීම හා ලේඛනගත කිරීම සහ අධිකාරියට වාර්තා කිරීම ;

(ඇ) පරිසරය ආරක්ෂ කිරීමට කරන ලද සවිකිරීම්වල සහ උපද්‍රවකාරි ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් සේවයෙහි යෙදී සිටින පුද්ගලයින්ට ඒ සම්බන්ධව ලිඛිත උපදෙස් නිකුත් කිරීම ;

(ඈ) පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට හා කාර්ය මණ්ඩලයට රාජකාරී කටයුතු සහ වගකීම් පැවරීම හා

